ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ විද්‍යා පදනම් පාඨමාලාව - 2 වන මට්ටම 2007/2008
අධ්‍යයන වර්ෂය - 2008
දේශපාලන විද්‍යාව හැදින්වීම : SSF 2301

කාලය : පැය තුනයි (03)

දිනය :2008.09.27 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරක් සඳහාම ලකුණු විස්සක් (20) ලැබේ.

1) පහත සඳහන් තේමාවන් 4ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(1) රාජ්‍යය
(2) සමාජය
(3) රජය
(4) ස්වාධිපත්‍යය (ලකුණු 4x5=20)

ලාල්විල් සටහන

2) රාජ්‍යයේ අරමුණු සම්බන්ධව ලිබරල්වාදීන් සහ මාක්ස්වාදීන් දරන්නේ වෙනස්වූ අදහස්ය. සාකච්ඡා කරන්න.

3) ප්‍රජාතන්ත්‍රවාදී රජයන් සමාජවාදී, අධිකාරීවාදී, සහ ෆැසිස්ට්වාදී රජයන්ට වඩා ජනතාවට සමීපව කටයුතු කරනු ලබයි." සාකච්ඡා කරන්න.

4). ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නාවූ සමානුපාතික නියෝජන ක්‍රමය තුළ ධනාත්මක මෙන්ම ඍණාත්මක ලක්ෂණ දක්නට ලැබේ. මෙම ක්‍රමය කලින් පැවති පන්ද කොට්ඨාස ආශ්‍රිත ක්‍රමය සමග සසඳමින් සාකච්ඡා කරන්න.

5) ඩොනමෝර් කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද මූලික ප්‍රතිසංස්කරණ මොනවාද?

6) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාරය මෙන්ම වාම ව්‍යාපාරය තුළින් ඉමහත් සේවයක් සිදු විය. සාකච්ඡා කරන්න.

7) 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු බලතල වලට වඩා වැඩි බලයක් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනාධිපතිවරයාට හිමි විය. සාකච්ඡා කරන්න.

8) පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් නිති සම්පාදනය කිරීමට හැකියාවක් ලැබෙනුයේ මහජනතාව හරහාද, මහජන නියෝජිතයන් හරහාද යන්න සාකච්ඡාවට ලක් කරන්න.

9) පහත සඳහන් තේමාවන් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(1) දේශපාලන විද්‍යාව විෂයක් ලෙස
(2) ෆෙඩරල් ආණ්ඩුක්‍රමය
(3) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ජනාධිපතිවරයකු බලයෙන් පහ කිරීම.
(4) බලය බෙදීම නම් වූ සිද්ධාන්තය
(5) මූලික අයිතිවාසිකම්

***** සියළුම හිමිකම් ඇවිරිණි *****